I·O·G·T
Alcohol and Drug Information Centre
ADIC

No.40/18, Park Road, Colombo 5, Sri Lanka.
Tel: +94 11 2584416, +94 11 2592515, Fax: +94 11 2508484
E-mail: info@adicsrilanka.org, adicc@sltnet.lk
Web Site: http://www.adicsrilanka.org

# මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකාවට සිගරට් ආනයනය කිරීම සඳහා අළුතින් බලපත්‍ර ලබාදීමට මුදල් අමාත්‍යාංශය ගනු ලැබූ තීරණය ආර්ථිකමය වශයෙන් රටට අතිශයින්ම හානිදායක තීරණයකි

සිගරට් යනු සෞඛ්‍යමය හා ආර්ථිකමය වශයෙන් රටකට ඉතා අවාසිදායක භාණ්ඩයකි. සිගරට් බීම නිසා වසරකට ශ්‍රී ලාංකිකයන් අකාලයේ 20,000 පමණ මරණයට පත් කරනු ලබයි. එමෙන්ම තවත් විශාල පිරිසක් සිගරට් බීම නිසා ඇතිවන රෝගාබාධ හේතුවෙන් ප්‍රතිකාර ලබයි. මීට අමතරව අක්‍රීය දුම්පානයට ගොදුරු වන සිගරට් නොබොන පිරිස් ද පීඩාවන්වලට හා රෝගවලට ලක් වී ඇත. විශේෂයෙන්ම ගර්භණී සමය තුළ දුම්පානයට නිරාවරණය වීම මළ දරු උපත් ඇති වීමට බලපායි. සිගරට් බීමෙන් රෝගීවන සහ මියයන පිරිස් වෙනුවෙන් 2015 වසරේ පමණක් රජයට රුපියල් බිලියන 90 කට ආසන්න සෞඛ්‍ය වියදමක් දරන්නට සිදු වී තිබේ. අපේ රටේ සිගරට් බොන්නන් දිනකට රුපියල් කෝටි 40කට ආසන්න මුදලක් සිගරට් සඳහා වියදම් කරයි. මොවුන් බහුතරය අඩු ආදායම් ලබන්නන් බව අධ්‍යයන වලින් තහවුරු වී තිබේ.

එවැනි මොහොතක මුදල් අමාත්‍ය මංගල සමරවීර මහතා 2019. 05. 30 දින මාධ්‍ය සාකච්ඡාවක් පවත්වමින් ප්‍රකාශ කර සිටියේ ,අප රටතුළ චීන සේවකයන් විශාල පිරිසක් සේවය කරන බවත්, එම සේවකයින් සඳහා චීනයේ නිෂ්පාදිත සිගරට් ලබා දීම වෙනුවෙන් චීන දුම්කොළ සමාගමක් ලංකාවට ගෙන ඒමට සුදානම් බවත් ය. එමගින් රජයට බදු ලෙස අමතර ආදායමක් ලබා ගත හැකි බව ද ඔහු තවදුරටත් ප්‍රකාශ කර සිටී.
මෙම නිවේදනය තුළ අප අවධානය යොමුකරන්නේ , පවතින සමාගමට අමතරව පිටරටින් සිගරට් ආනයනය කිරීමට නව බලපත්‍ර ලබා දීම අපේ රටේ ආර්ථික, සෞඛ්‍ය හා සමාජීය අංශ ඔස්සේ රටට සහ සමාජයට බලපාන අයුරුය.

1. මුදල් අමාත්‍යාංශයේ මූලික අරමුණ වන්නේ රජයට ලැබෙන ආදායම් වැඩිකර ගැනීම නම්, ඔවුන් කළ යුත්තේ දැනට පවතින සිගරට් සමාගමේ නිෂ්පාදනයන් සඳහා නිවැරදි බදු ක්‍රමයක් හඳුන්වා දී එම මුදල් රජයට ලබා ගැනීමයි. එවන් හැකියාවක් තිබෙන මොහොතක, වෙනත් දුම්කොළ සමාගමක් ගෙන්වා එම අරමුණ ඉටු කරගැනීමට උත්සාහ කිරීම ගැටළු සහගතය. මුදල් අමාත්‍යාංශයේ දෝෂ සහිත බදු ප්‍රතිපත්තිය නිසා රජයට ලබා ගත හැකිව තිබූ විශාල දුම්කොළ <u>බදු</u> ප්‍රමාණයක් මේ මොහොතෙත් අහිමි වෙමින් පවති. පසුගිය වසර පහක කාලය (2013-2018) තුළ පමණක් රටට ලැබීමට තිබූ රුපියල් බිලියන 100කට ආසන්න මුදලක් රටට අහිමි විය. එබැවින් පවතින දුම්කොළ සමාගමෙන් පවා නිවැරදි බදු අය කරගැනීමට ක්‍රමවේදයක් සකස් කිරීමට අසමත් මුදල් අමාත්‍යාංශය නව සමාගම් හඳුන්වාදීම මගින් ආදායම් වැඩි කරගන්නවා යැයි ප්‍රකාශ කිරීම ම විහිළුවකි.

2. රජය විසින් පසුගිය වසර 5ක කාලය තුළ සැලකිය යුතු මුදලක් දුම්කොළ පාලනය සඳහා යොදවා ඇත. එම දුම්කොළ පාලන ක්‍රමවේද ලෙස සිදුකරන ලද ප්‍රතිපත්ති සම්පාදනය, නීති සම්පාදනය, පවතින නීති ක්‍රියාත්මක කිරීම සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස මේ වන විට අප රටේ සිගරට් භාවිතය 14% ක් වැනි අගයක පවතින අතර, සතුටුදායක කරුණ වන්නේ අප දැන් ගමන් කරන්නේ සිගරට් භාවිතය අඩු වෙමින් යන දිශාවටය. ලෝක බැංකුවේ නිර්දේශ අනුවද, දියුණුවෙමින් පවතින රටවල දුම්පානයේ ප්‍රවණතාවය වැඩි වීම එම රට ආර්ථිකව දුර්වල වීමට බලපාන බව පෙන්වා දෙයි. එමෙන්ම සිගරට් බීම අඩුවීම තුළ අඩු ආර්ථික මට්ටම් සහිත පවුල් වල ආර්ථිකය ශක්තිමත් වන බව පෙන්වා දි ඇත. නමුත් සිගරට් ආනයනය කිරීම සඳහා නව බලපත්‍ර නිකුත් කිරීමේ තීරණය සමග අප රටේ සිගරට් භාවිතය වැඩිවන ප්‍රවණතාවයක් ඇතිවීම වැළැක්විය නොහැකිය.

3. ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් දුම්කොළ පාලනය සඳහා,දුම්කොළ පාලනය පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය"(FCTC)" හඳුන්වා දී තිබේ. දුම්බීම නිසා සිදුවන ආර්ථික හානිය අවම කිරීම මෙම සම්මුතියේද ප්‍රධාන අරමුණක් වී ඇත. අප රටද එම සම්මුතියට අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා එම ගිවිසුමට අත්සන් කර ඇති අතර, එම නිර්දේශ සාර්ථකව ක්‍රියාවට නංවමින් සිටින රටවල් අතර පෙරමුණේ සිටී .

4. දුම්බීම නිසා ශ්‍රී ලංකා රජයට වසරකට සිදු වන ආර්ථික පාඩුව රුපියල් බිලියන 90 කට ආසන්න බව ලෝක සෞඛ්‍ය සංවිධානය සහ දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය විසින් ගණනය කර ඇත. මෙම සිගරට් සඳහා බලපත්‍ර ලබාදීමේ තීරණයත් සමඟ මෙම පාඩුව බෙහෙවින් වැඩිවීමට ඉඩ ඇත .

5. සිගරට් සමාගම් කිහිපයක් තිබීම තුළ වෙළඳපොළ තරඟකාරීත්වයක් ඇතිවීමෙන් සිගරට් අලෙවි කිරීමේ තරඟකාරිත්වය වැඩිවීම හේතු කොටගෙන ප්‍රචාරණ උපක්‍රම වැඩි වීම, දුම්කොළ සමාගමේ මැදිහත්වීම ඉහළයාම, දේශපාලඥයන් මුදලට ලබාගැනීමට උත්සහ කිරීම, ඡන්ද ව්‍යාපාර සඳහා මුදල් ලබාදීම, නීති විරෝධී අනුග්‍රහ දැක්වීම ආදිය දෙගුණ තෙගුණ වීම අනිවාර්ය වේ. මෙවැනි පසුබිමක රටේ ඉදිරි අනාගතය වන දරුවන් සිගරට් මෙන්ම වෙනත් මත්ද්‍රව්‍යවලට නැඹුරුවීමේ ප්‍රවණතාවය සීග්‍ර ලෙස වර්ධනය වනු ඇත. (සිගරට් යනු නීති විරෝධී මත්ද්‍රව්‍ය වන ගංජා, හෙරොයින් වැනි මත්ද්‍රව්‍ය සඳහා ප්‍රවේශකාරී මත්ද්‍රව්‍යක් ලෙස ක්‍රියා කරයි.)

6. චීන ජාතිකයින් අතුළු විදෙස් ශ්‍රමිකයන්ගේ සුබසාධනය පිළිබඳ රජය අවංකවම සැළකිලිමත් වෙනවා නම් සිදු කල යුත්තේ ඔවුන්ගේ සිගරට් බීම අවම කිරීමට උදව් කිරීමයි. මන්ද යත් අවාසිදායක සිගරට් බීමේ පුරුද්දෙන් ඉවත්වීමට රජය සිගරට් බොන පිරිසට උදව් කළයුතුය.සිගරට් බීම පුද්ගලයන්ගේ ඵලදායීතාව අඩු කරන ප්‍රධාන හේතුවක් වන බැවින් ශ්‍රමිකයින්ට හිතැති රජයක් විසින් කිසිවිටෙක ඔවුන්ගේ සිගරට් බීම වර්ධනය කරවන තීරණ නොගත යුතුය.

7. දුම්කොළ ඇසුරුම් මත රූපමය සෞඛ්‍ය අවවාද දැමීමේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ගෙන එනු ලැබූ යෝජනාවට විරුද්ධව ලංකා දුම්කොළ සමාගම නමින් පෙනී සිටින බ්‍රිතාන්‍ය ඇමෙරිකානු දුම්කොළ සමාගම අධිකරණ ක්‍රියා මාර්ගවලට පිවිස, රූපමය සෞඛ්‍ය අවවාද ගෙන ඒම අවුරුදු 3 කින් ප්‍රමාද කිරීමට ගත් අතිමහත් උත්සාහය ගැන අපට අත්දැකීම් ඇත. එවන් තත්වයක දුම්කොළ පාලනය පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට අත්සන් නොකළ තවත් සමාගමකට ලංකාවට පැමිණීමට ඉඩදීම , දුම්කොළ පාලනය පිළිබඳ ප්‍රතිපත්තියට විරුද්ධ අකාරයෙන් බලපාන බව පැහැදිලිය.

8. දැනට අප රටේ ක්‍රියාත්මක වන මහා පරිමාණ ව්‍යාපෘති බොහොමයක් ක්‍රියාත්මක කරනුයේ චීන සමාගම් සහ චීන ආධාර මතය. එවැනි තත්වයක් තුළ චීන සිගරට් සඳහා අවශ්‍ය ආකාරයට බදු හා නීති පනවමින් ඒවා පාලනය කිරීමට ශ්‍රී ලංකා රජය ගනුලබන උත්සාහයන් අඩපණ කිරීමේ හැකියාවක් චීන රජයට පවතී.

9. අප රටේ මුළු ජනගහනයෙන් ඉතාමත් අඩු මෙන්ම තාවකාලිකව සේවයේ යෙදෙන චීන ජනතාව වෙනුවෙන් චීනයෙන් සිගරට් ගෙන්වීමට අවසර ලබා දීම කොතරම් උචිතද ? චීන ජාතීන් මෙලෙස වෙනත් භාණ්ඩ ඉල්ලුම් කලහොත් එම සමාගම්වලටත් භාණ්ඩ ගෙන්වීමට අවසර ලබා දෙන්නේ ද? තවද අනෙකුත් රටවලට අයත් ජාතීන් විසින් ද මෙලෙස ඉල්ලීම් කලහොත් ඒ පිළිබඳවත් මුදල් ඇමතිතුමා සැළකිලිමත් ද?

අප රටේ මුදල් අමාත්‍යාංශය විසින් දුර දැකීමකින් තොරව ගනුලබන මෙවැනි තීරණ මගින් ශ්‍රී ලංකාව සෞඛ්‍ය, සමාජීය සහ ආර්ථික වශයෙන් පරිහානියට පත්වනවා මෙන්ම විදෙස් ශ්‍රමිකයන්ගේ  සෞඛ්‍ය හා ආර්ථික ගැටළුවලට ද මෙම තීරණ හේතු වේ.

එබැවින් ජනාධිපතිතුමා ,අගමැතිතුමා , සෞඛ්‍ය ඇමතිතුමා ඇතුළු සියලු වගකිවයුතු පාර්ශව වලින් අප ඉල්ලා සිටින්නේ මෙම අවාසි සහගත තීරණය වෙනස් කිරීමට හැකි උපරිමයෙන් කටයුතු කරන ලෙසය.



පුබුදු සුමනසේකර
විධායක අධ්‍යක්ෂ
මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය
දුරකතන අංකය  : + 94 716823998
2019.06.10